ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-10-18 |

පැමිණිලි පාර්ශවය :- ආනන්දරාජ් ලියනගේ කහවත්ත මයා,
උප තැපැල් කාර්යාලය බාරේ,
දේවාලහිඳ, ඉඟිණියාගල.

වගඋත්තර පාර්ශ්වය :- 01. උද්‍යාන භාරකරු,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඉඟිණියාගල.

02. ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දමන.

03. ප්‍රදීප් මුණසිංහ මහතා,
ගල්ඔය උද්‍යාන භාරකරු,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේනතුව,
ඉඟිණියාගල.

04. සහකාර කොමසාරිස්,
ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය,
අම්පාර.

05. අධ්‍යක්ෂ,
මධ්‍යම පරිසර අධිකාරිය,
දිස්ත්‍රික් කාර්යාලය,
අම්පාර.

06. ඩී.එම්.පී.එන්.ප්‍රියන්ත මහතා,
හත්පොත අඩවි සහකාර,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
ඉඟිනියාගල.

පැමිණිලි අංකය : HRC/AM/56/19/T/AD

පැමිණිල්ලේ සඳහන් කරුණු :-

2019.08.01 වන දින ඉහත පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, තමා රජයට අයවිය යුතු මුදල් ගෙවා අනුමැතිය ලබාගත යුතු සියලුම ආයතනවල අධීක්ෂණය සහ අනුමැතිය සහිතව ලබාගත් කෙසෙල්වත්ත ග්‍රාමයේ IML/B/HO/1293 දරණ බලපත්‍රය අනුව, ගොඩවැලි කැණීම් සිදුකරන අවස්ථාවේ එයට යොදා ගත් එක්ස්වේටර් යන්ත්‍රය හා එහි සේවකයින් දෙදෙනා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවටගෙන අම්පාර දිසා අධිකරණයට ඉදිරිපත් කළ බව සඳහන් කර ඇත.

නීත්‍යානුකූලව බලපත්‍ර ලබා අදාළ ගොඩවැලි කැණීම් කටයුතු ආරම්භ කර තිබියදී මෙසේ අත්අඩංගුවට ගැනීම හා අධිකරණයට ඉදිරිපත් කිරීම තුළ තමා ආර්ථික වශයෙන් දැඩි පීඩාවකට පත් වූ බවත්, ඒ අනුව අදාළ නිලධාරීන් තමාගේ මූලික අයිතිවාසිකම් කඩකර ඇති බැවින්, ඒ පිළිබඳ විමර්ශනය කර සහනයක් සලසන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් නිකුත් කළ අංක IML/B/HO/12933 දරණ කාර්මික කැණීම් බලපත්‍රය පිටපතක්ද පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම:-

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට, අධ්‍යක්ෂ මෙහෙයුම් මංජුල අබේරත්න මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් තම දෙපාර්තමේන්තුවෙන් ගල්ඔය ජාතික උද්‍යානයේ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත 2019/06/27 වන දින ගල්ඔය නිරිතදිග අභයභූමියේ කෙසෙල්වත්ත ප්‍රදේශයේ සිදුකළ වැටලීමකදී රජයේ ඉඩමක වැලි හාරමින් සිටි දෙදෙනෙක් අත්අඩංගුවට ගන්නා ලද බව දන්වා ඇත. ඒ පිළිබඳ විමර්ශනයේදී ඒ සඳහා බලපත්‍ර ලබාගෙන ඇත්තේ ආනන්දරාජ් කහවත්ත ලියනගේ යන අය බව අනාවරණය වූ බවත්, පසුව අධිකරණය

විසින් නිකුත් කළ සිතාසියක් මඟින් ඔහු කැඳවා ප්‍රකාශයක් ලබා ගෙන ඇති බවත් දක්වා ඇත. එම පුද්ගලයා තම නිලධාරීන් මීට පෙර පුද්ගලිකව හෝ රාජකාරීව දැන නොසිටි බවත්, මෙම වැටලීම සිදුකළ සිද්ධි ස්ථානය වර්ෂ 1954/02/12 වන දින අංක 10640 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කළ ගල්ඔය නිරිත දිග අභය භූමියට අයත් ස්ථානයක් බවත්, ඒ අනුව අදාළ සිද්ධි ස්ථානය රජය සතු ඉඩමක් වන බැවින් ඒවායේ සිදුකරන නීතිවිරෝධී ක්‍රියා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම වනජීවී නිලධාරීන්ගේ කාර්යභාර්ය වන බවත් දන්වා ඇත.

එසේම මෙම වැටලීම සම්බන්ධව BR/7585/19 යටතේ අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඉදිරි විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා ඇත. කොමිෂන් සභාවේ විමර්ශන මඟින් අධිකරණ කටයුතු සඳහා අගතියක් සිදු වීමට ඉඩ ඇති බැවින් එම අධිකරණ කටයුතු අවසන් වන තුරු උක්ත පැමිණිල්ල බහා තබන ලෙසද ඉල්ලා ඇත.

එසේම කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ආඥා පනත අනුව, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් මෙයට පෙර දැනුවත් කර ඇති බවත්, බලපත්‍රය ලබාදීමේදී රජයේ නිලධාරීන් වැරැද්දක් කර ඇති බවත් සඳහන් කර ඇත.

ගොවිජන සංවර්ධන කාර්යාලය ගොඩවැලි ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති ඉඩම අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේවාලගිඳ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පල්ලන්ඔය වසම් ගොවිජනසේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ පිහිටා ඇති බවත්, තම ආයතනික කොන්දේසි හා අනෙකුත් ආයතනවල කොන්දේසිවලට යටත්ව මෙම ඉඩමත් ගොඩවැලි කැණීම් සඳහා බලපත්‍ර ලබාදීම සුදුසු බව නිර්දේශ කර ඇති බව එම ආයතනය කොමිෂන් සභාව වෙත යොමුකළ සිද්ධියට අදාළ ලේඛන මඟින් පැහැදිලි වේ.

ප්‍රාදේශීය ලේකම්, දමන නියෝජිත ජනපද නිලධාරී පී.ඩබ්.ඒ.බස්නායක යන අය විසින් කොමිෂන් සභාව වෙත සඳහන් කර ඇත්තේ, අදාළ ඉඩම වනජීවී දෙපාර්තමේන්තුව සිය සීමා මායිම් කළ මායිම් කණුවලට පිටතින් පිහිටා ඇති බැවින් රජයේ ඉඩම් සේ සලකා ගොඩවැලි කැණීමේ බලපත්‍රය සඳහා අනුමැතිය ලබාදී ඇති බවත්, එසේම අදාළ ප්‍රදේශයේ ඉඩම් සඳහා ද එම පදනම මත ඇති බලපත්‍ර ලබා දී ඇති බවද සඳහන් කොට ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිලධාරී කේ.එච්.නිරෝෂන් මහතා විසින් දන්වා ඇත්තේ, ප්‍රාදේශීය ලේකම් අදාළ ඉඩම රජයේ ඉඩමක් බව සඳහන් කර තිබූ බැවින් තම ආයතනය මෙම ස්ථානය පරීක්ෂා කර අදාළ නිර්දේශ ලබාදීම සිදුකළ බවයි.

**පැමිණිල්ලේ ප්‍රතිවිරෝධතා :-**

පැමිණිල්ල ඉහත කරුණු පිළිබඳව ප්‍රතිවිරෝධතා ගොනු කරමින් 1990 වර්ෂයේ වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් BWC සලකුණ සහිත මායිම් ගල් යොදා වනජීවී සීමාව ලකුණු කර ඇති බවත්, එම මායිම් ගල් දෙමටඇල්ල ප්‍රදේශයේ සිට කෙසෙල්වත්ත ග්‍රාමය වෙන් කර සේනානායක සමුද්‍රය දක්වාම යොදා ඇති බවත්, එම කණු යෙදීම එවකට ගල්ඔය උද්‍යාන භාරකරු මනොජ් විද්‍යාරත්න මහතාගේ උපදෙස් මත සිදු වූ බවත්, 1990 වර්ෂයෙන් පසුව ගල්ඔය නිරිත දිග අභය භූමියෙන් කෙසෙල්වත්ත ග්‍රාමය නිදහස් කළ පසු එම ප්‍රදේශවාසීන්ට LDO බලපත්‍ර 50 කට අධික ප්‍රමාණයක් මෙම ගම්මානයට ජල විදුලි බල පහසුකම් මෙන්ම කොන්ක්‍රීට් යොදා තැනූ මාර්ග ද පාලම් ද ආදියද ඉදිකර ඇති බවත් දන්වා ඇත.

එසේම 2008/02/18 දේවාලහිඳ පදිංචි ඩී.එම්.රන්බණ්ඩා මහතාට ගල් කොරියක් පවත්වා ගෙන යාම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීම සඳහා වනජීවී රක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රදේශය අයත් නොවන බවට ලිපියක් නිකුත් කර ඇති බවද දන්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු:-**

ගැටලුවට තුඩුදී ඇති පැමිණිලි පාර්ශවය වෙත නිකුත් කර ඇති භූවිද්‍යා හා පතල් කැණීම් බලපත්‍ර අංක IML/B/HO/12933 දේවාලහිඳ බලපත්‍රය නීත්‍යානුකූල ලෙස නිකුත් කර ඇති බව අනාවරණය වේ. බලපත්‍රය සඳහා රුපියල් 49,960 ක් මුදලක් ගෙවා ඇති අතර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත රු:3,000 ක් සහ මධ්‍යම පරිසර අධිකාරිය වෙත රු:10,200 ක මුදලක් ගමන් වියදම් සඳහා ගෙවූ බව පැමිණිලිකරු සඳහන් කර ඇත.

උක්ත බලපත්‍රය ලබාදීමේදී භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යංශය පහත නිලධාරීන් දැනුවත් කිරීම හා ඔවුන්ගේ නිර්දේශ ලබා ගැනීම කර ඇති බව අනාවරණය වේ.

1) ප්‍රාදේශීය ලේකම් ,දමන.
2) මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථානාධිපති ,අම්පාර.
3) සහකාර අධ්‍යක්ෂ, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, අම්පාර.
4) සහකාර අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, අම්පාර.
5) අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අම්පාර.
6) සහකාර අධ්‍යක්ෂ, ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය, අම්පාර.
7) සහකාර පොලිස් අධිකාරී , අම්පාර.

ඒ අනුව ඉහත නිලධාරින් මෙම ස්ථානය පරීක්ෂා කර ඉන් අනතුරුව සිය නිර්දේශ ලබාදී ඇති බව අනාවරණය වේ.

එසේම වනජීවී දෙපාර්තමේන්තුව BWC සලකුණ සහිත මායිම් කණු සිටුවා ඇති මායිමට පිටින් අදාළ ඉඩම පිහිටා ඇති බවද අනාවරණය වේ.

එම ප්‍රදේශය පුද්ගලයන් පදිංචි දේවාළහිඳ නැමැති ගම්මානයේ පිහිටා ඇති අතර, එම ගම්මානයේ කොන්ක්‍රීට් කළ රජයෙන් ඉදිකළ මාර්ග මෙන්ම පාලම් බොක්කු ආදිය ඇති අතර, අදාළ ඉඩම් සඳහා LDO බලපත්‍ර හා ජයභූමි දීමනා පත්‍රද ප්‍රදානය කර ඇති බව අනාවරණය වන වී ඇත. ඒ කිසිවක් සඳහා වනජීවී දෙපාර්තමේන්තුව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව අනාවරණය වේ. තවද 1954/02/12 වන දින අංක 10640 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් නිවේදනය පල්ලන්වෙල සිට සයිබන් එක දක්වා මායිම් රේඛාවකින් මායිම් සලකුණු වන බව දක්වා ඇති බවද අනාවරණය වී ඇත.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ එම්.ඒ.සී.රූපසිංහ (නැගෙනහිර ප්‍රදේශය) අංක වජී/නැ/3/03/03134/2008 හා 2018/02/08 දිනැති ලිපියෙන් දමන ප්‍රා.ලේ.කොට්ඨාශයේ දේවාළහිඳ ග්‍රාම සේවා නිලධාරී වසමේ පිහිටි රජයේ රක්ෂිතය තුළ ඩී.එම්.බණ්ඩා මහතා පවත්වාගෙන යන ගල්කොරිය වනජීවී රක්ෂිතය තුළ හෝ ජාතික රක්ෂිතයක මායිමේ සිට සැතපුම් එකක දළ සීමාව තුළ පිහිටා නොමැති බව උද්‍යාන භාරකරු ගල්ඔය තමාට දන්වා ඇති බව දන්වා ඇත. වනජීවී අධ්‍යක්ෂ ජනරාල් එච්.ඩී.රත්නායක මහතාගේ අංක වජී/6/198/60/ හා 2015/12/10 දරණ හේමා ජයවර්ධන 3/17, කෙසෙල්වත්ත, දේවාලහිඳ, අම්පාර වෙත යොමු කළ ලිපිය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු යොදා ඇත්තේ ජල පෝෂක ප්‍රදේශ ලෙස හා ගම්මාන ඉවත් කර ප්‍රකාශයට පත්කළ ගල්ඔය නිරිත දිග අභය භූමි මායිම් වන අතර, (BWC සලකුණ සහිත) විදුලි වැට ඉදි කිරීමට පියවර ගෙන ඇත්තේද එම මායිම් ඔස්සේ බව දන්වා ඇති බවද අනාවරණය වී ඇත.

එසේම ගොඩවැලි කැණීමට පැමිණිලිකරු බලපත්‍ර ලබාගත් ඉඩම කේ.එම්.සරත් කුමාර හා ඩබ්.ඒ.රුවන් කුමාර යන දෙදෙනා දීර්ඝ කාලීනව වාර්ෂිකව ගොඩ වැලි සඳහා සහ වගා කළ රජය සතු ඉඩමක් බවද අනාවරණය වී ඇත.

**නිරීක්ෂණ :-**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 1954/02/12 වන දින අංක 10640 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කළ ගල්ඔය නිම්න අභය භූමිය ගැටලුවට අදාළ ස්ථානයට අයත් බව දක්වමින් අදාළ ගැසට් නිවේදනය ඉදිරිපත් කර ඇත. එමෙන්ම දැනට යොදා ඇති මායිම් කණු නිවැරදි

නොවන බවද එය බිම් සලකුණු කිරීමේ ආඥා පනත අනුව සිදු නොකර ඇති බවද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේනතුවේ ගල්ඔය උද්‍යාන භාරකරු ප්‍රදීප් මුණසිංහ මහතා පවසා සිටියද,

වනජීවී අධ්‍යක්ෂ ජනරාල් අම්පාර දේවාළහිඳ හේ.මු.විජේවර්ධන මහතාට නිකුත් කළ වජී/6/12/601 හා 2016/12/10 දිනැති ලිපියෙහි හතරවන ඡේදයෙන් 'වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු යොදා ඇත්තේ ජල පෝෂක ප්‍රදේශ ලෙස ගම්මාන ඉවත් කර ප්‍රකාශයට පත් කළ ගල්ඔය නිරිත දිග අභය භූමි මායිම් වන අතර අදාළ වැට ඉදිකිරීමට පියවර ගෙන ඇත්තේද එම මායිම් ඔස්සේ බව' සඳහන් කර ඇත. ඒ අනුව දැනට මායිම් කණු යොදා ගල්ඔය නිරිත දිග අභය භූමි මායිම සලකුණු කර ඇති බව තහවුරු වේ. ඒ අනුව පැමිණිලිකරු වෙත භූවිද්‍යා හා පතල් කැණීම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති බලපත්‍රයට අයත් ඉඩම එම වනජීවී සීමාවෙන් පිට පවතින බව තහවුරු වේ. එසේම වනජීවී තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ එම්.ඒ.සී.රූපසිංහ මහතා නැගෙනහිර ප්‍රදේශය ප්‍රදේශීය ලේකම් දමන, වෙත නිකුත් කළ අංක වජී/නැ/3/03/03/134/2008 හා 2018.02.08 දිනැති ලිපියෙන් ද ඒ බව පැහැදිලි වේ.

ඒ අනුව පැමිණිලිකරු වෙත භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය විසින් විධිමත් ලෙස මුදල් අයකර ගොඩවැලි කැණීමේ බලපත්‍රයක් ලබාදී තිබියදී බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය නොකළ ඔහුට එසේ අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම නීත්‍යානුකූල නොවන බවත් අධිකරණමය ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙන්නේ අදාළ බලපත්‍ර නිකුත් කිරීම හා නිර්දේශ ලබා දුන් ආයතන ප්‍රධානීන් සම්බන්ධව වන බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

එසේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 1952/02/12 වන දින අංක 10640 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් නිවේදනය පමණක් ඉදිරිපත් කරමින් අදාළ ඉඩම එයට අයත් බව පැවසුවද එය තහවුරු කිරීමට වෙනත් සිතියමක් හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමක්ද සිදුකර නොමැති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මේ අනුව පැමිණිලි පාර්ශවය විසින් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශය මඟින් නීත්‍යානුකූල මාර්ගයෙන් ලබා ගන්නා ලද බලපත්‍රයක් මත සිදු කරන ලද ව්‍යාපාරික කටයුත්ත නතර කිරීම හා පැමිණිලිකරුට එරෙහිව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම නීතියට පටහැනි ක්‍රියාවක් බවත්, වගඋත්තර පාර්ශවය මේ ආකාරයෙන් නීතියට පටහැනිව ක්‍රියා කිරීමෙන් පැමිණිලිකරුට ඇති නීතියේ ආරක්ෂාව මෙන්ම සිය නීත්‍යානුකූල වෘත්තියක නියැලීමට ඇති අයිතියද උල්ලංඝනය වී ඇති බවත් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) හා 14(1) (g) මඟින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) හා 14(1) (g) මඟින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින් පැමිණිලිකරු වෙත භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශය නීත්‍යානුකූලව නිකුත් කර ඇති IML/B/HO/12933 දරණ බලපත්‍රය අනුව කටයුතු කිරීමට වගඋත්තර පාර්ශවය විසින් බාධා නොකළ යුතු බවටත්, එකී බලපත්‍රය අනුව කටයුතු කිරීමට පැමිණිලිකරුට නීතිමය බාධාවක් වෙතොත් වගඋත්තර පාර්ශවය විසින් එය ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.11.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/